**මහඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------(අ)**
**ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. 2017 වර්ෂයේදී රු.2,577,617 ක් වැය කර ඉදිකර තිබූ උණු වතුර බුබුලේ කඩකාමර 07 ක් සහ කැකිරි හේන සාප්පු සංකීර්ණයේ දෙවන අදියර යටතේ අත්වැට සකස් කිරීම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | ලබන වර්ෂයේ අවසන් ගිණුම් සඳහා ගැලපීම් කිරීමට කටයුතු කරමි. |
| ii. දෙවන සෞඛ්‍ය වැඩසටහන යටතේ මිලදී ගෙන තිබුණු ට්‍රෙලර් බවුසරයේ වටිනාකම වන රු.335,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | එය ලබන වර්ෂයේ ගිණුම් සැකසීමේ දී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| iii. 2013 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකර 2018 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පවරන ලද මහඔය බස්නැවතුම්පල හා කඩකාමර තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | 2013 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන යටතේ ඉදිකරනු ලැබූ මහඔය බස් නැවතුම් පල හා කඩ කාමර 2018.03.16 වන දින අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් මහඔය ප්‍රාදේශීය සභාව වෙත පවරා දී ඇති නමුත් එහි වටිනාකම සම්බන්ධයෙන් |

| | | |
|---|---|---|
| | | කිසිදු ලියවිල්ලක් අප වෙත භාර දී නොමැත. එබැවින් එය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ප්‍රාග්ධනිත කිරීමක් සිදු කිරීමට නොහැක. එම කඩ කාමර තක්සේරු කළ ටෙන්ඩර් පටිපාටිය මගින් කුලියට දීම මේ වන විට සිදු කර ඇත. |
| iv. 2018 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවේ වෙබ් අඩවිය නිර්මාණය සඳහා දරන ලද රු.130,000 ක වටිනාකම අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | එයට අදාල ගැලපීම් කර අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| v. 2018 වර්ෂය සඳහා සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලැබිය යුතු රු.2,570,288 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | සිදු වූ අතපසු වීමකින් ගිණුම් ගත කිරීමට නොහැකි වූ බැවින් 2019 වර්ෂයට අදාලව ගිණුම් ගත කර ඇත. |
| vi. 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.229,845 ක් රු.89,185 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | 2016 දෙසැම්බර් 31 දිනට රු.136,795 ක, 2017 දෙසැම්බර් 31 දිනට රු.76,520 ක හා 2018 දෙසැම්බර් 31 දිනට රු.16,530 ක හිඟ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට කටයුතු කරමි. |
| vii. 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.332,675 ක් මූල්‍ය ප්‍රකාශන වල රු.70,946 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | ලේඛන ගත කිරීමේ දී වැරදියට ලේඛන ගත කර ඇති අතර 2013 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට රු.332,675 ක මුදලක් ගෙවිය යුතු වේ. එහෙත් 2018 වර්ෂයේ දී රු. 49,293 ක මුදලක් ගෙවූ අතර ඉතිරි රු.381,968 ක මුදල ආදායම් බදු දෙපාර්තමේන්තුව ගෙවීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| viii. 2018 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති දෙකකට අදාල අතරැඳවුම් මුදල් රු.94,492 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | අතපසු වීමක් නිසා ගිණුම් ගත කර නොතිබූ අතර මේ වන විට ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. |
| ix. දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලෙහි 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ පොලිය වන රු.553,811 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | ඉදිරියේ දී එයට අදාලව ගැලපීම් සිදු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| x. | දේශීය ණය හා සංවර්ධන අරමුදල යටතේ ලබාගත් ණය වෙනුවෙන් 2014 අප්‍රේල් මාසයට පෙර කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද රු.105,492 ක හිඟ ණය පොලිය සමුච්චිත අරමුදලට ගැලපීම් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | ඉදිරියේ දී එයට අදාල ගැලපීම් සිදුකර සමුච්ඡිත අරමුදලට ගැලපීමට කටයුතු කරමි. |
| xi. | ආදායම් වෙනුවෙන් තැන්පතු ගිණුමෙන් ආදායමට හිලව් කළ යුතු රු.1,347,316 ක් වෙනුවට රු.1,721,316 ක් හිලව් කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | වැඩිපුර දක්වා ඇති රු.374,000 ක මුදල ගැලපීම් කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් රු.121,678,390 ක් වුවද, උපලේඛන අනුව රු.83,835,119 ක් වූයෙන් රු.37,843,271 ක නොසැසඳීමක් විය. | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ.. | සභාවට යෝජනාවක් ඉදිරිපත් කර 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් නොකරන ලද වත්කම් සම්බන්ධව තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කරන අතර එම කමිටුව මගින් ඉදිරිපත් කරන වත්කම් වල අගයන් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.311,021 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෙවිය යුතු එම මුදල කඩිනමින් ගෙවීම සඳහා සභා තීර්ණයක් ලබා ගැනීමට කටයුතු කර අදාල මුදල් ගෙවීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.122,195,515 ක වත්කම් විෂයයන් 04 ක් හා රු.54,567,886 ක වගකීම් විෂයන් 02 ක් ලේඛන, උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම**

**------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| i. 19 (i) හා (ii) වගන්ති | සභාව විසින් 2013 හා 2014 වර්ෂ වලදී ආදේශක රියදුරකු හා අනියම් සෞඛ්‍ය කම්කරුවෙකු පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව බඳවා ගෙන තිබුණි. | සභා පනතේ සඳහන් කර ඇති විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | 2018 වර්ෂයේ ඔක්තෝම්බර් මස සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු ලබා ගත් සභා අනුමැතියක් සමග ආදේශක පදනම මත බඳවා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. |
| ii. 132 (ඊ) වගන්තිය | අමාත්‍යාවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වේච්ඡා සමිති සඳහා රු.1,584,660 ක් වටිනා ද්‍රව්‍ය හා භාණ්ඩ බෙදාදීමට මිලදී ගෙන තිබුණි. | සභා පනතේ සඳහන් කර ඇති විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ආණ්ඩුකාරතුමා වෙත අනුමැතිය සඳහා ලිපි යොමු කර ඇති අතර, අදාල අනුමැතිය ලබා දෙන තුරු සභා තීරණයට අනුව හානියට පත් නිවාස වලට සහන සැළසීමට කටයුතු කරන ලදී. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | සභාව සතු යන්ත්‍රෝපකරණ සඳහා සිදුවන අලාභ හානි ඇතුලත් කිරීමට හානි හා පාඩු ලේඛනයක් මේ වනවිට නඩත්තු කරමින් පවති. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,465,381 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,767,509 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් (රු.මිලියන) | බිල්කළ ආදායම් (රු.මිලියන) | රැස්කළ ආදායම් (රු.මිලියන) | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.මිලියන) | ඇස්තමේන්තුගත ආදායම් (රු.මිලියන) | බිල්කළ ආදායම් (රු.මිලියන) | රැස්කළ ආදායම් (රු.මිලියන) | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.මිලියන) |
| වරිපනම් හා බදු | 400 | 439 | 439 | - | - | 383 | 383 | - |
| කුලී | 7,531 | 9,526 | 8,090 | 1,435 | 6,612 | 6,013 | 5,902 | 453 |
| බලපත්‍ර ගාස්තු | 290 | 348 | 348 | - | 286 | 302 | 302 | - |
| වෙනත් ආදායම් | 5,048 | 8,232 | 7,860 | 371 | 4,778 | 6,391 | 6,019 | 323 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය මූලික මූලික පහසුකම් වලින් සමන්විත ප්‍රදේශයක් වුවද, සභාව විසින් මේ දක්වා වරිපනම් බදු අය කිරීමක් සිදුකර නොතිබුණි. | වරිපනම් බදු අයකිරීමට අවශ්‍ය කටයුතු කලයුතු වේ. | මහඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වරිපනම් බදු අය කිරීමට සභා අනුමැතිය නොලැබීම නිසා වරිපනම් බදු අය නොකල අතර අදාලව මූලික පියවර මේ වන විට ගෙන ඉදිරි වර්ෂයේ දී වරිපනම් බදු අයකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**2.2.3 කුළී ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු කඩකාමර 28 කින් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කඩකාමර කුලිය රු.202,494 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කඩකාමර කුලි අයකරගත යුතුවේ. | මේ වන විට රු.50,000 ක මුදලක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා මේ වන විට කඩ හිමියන් වෙත ලිපි මගින් දැනුවත් කර ඇත. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.265,667 ක් හා මුද්දර ගාස්තු රු.105,715 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකරගත යුතු වේ. | මහේස්ත්‍රාත් අධිකරණයෙන් සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර අය කර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා 05 ක් පමණක් සකස් කොට තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**(ඇ) අත්හැර දැමූ කර්තව්‍යන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ උණු වතුර බුබුල අවට පරිසරය නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.535,936 ක් වැයකර නවාතැන්පලක් ඉදිකර තිබුණු නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එහි වැඩ අවසන් නොකර අත්හැර දමා තිබුණි. | ඉදිකිරීම් නිමකර භාවිතයට ගතහැකි මට්ටමට පත්කල යුතු වේ. | එම ව්‍යාපෘතිය සඳහා රු.1,653,779 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණු අතර, 2017 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට වැඩ අවසන් කරන ලද්දේ රු.535,936 ක ප්‍රමාණයකි. ඉතිරි වැඩ කොටස අවසන් කිරීම සඳහා 2018 වර්ෂයේ මුදල් ලබා නොදුන් බැවින් එම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට නොහැකි විය. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කල යුතු වේ. | තිරසාර සංවර්ධනය පිළිබඳ දැනුවත් වී තිබුණත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැනුවත් වී නොමැත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 05 ක පුරප්පාඩු 08 ක් පැවති අතර ආදේශක පදනම මත සේවකයින් 08 දෙනෙකු බඳවාගෙන තිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගැනීම හා අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සිදුකල යුතු වේ. | ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා සේවකයින් අත්‍යවශය වුවත් ස්ථිර සේවකයින් ප්‍රමාණවත් නොවන බැවින් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ආදේශක පදනම |

| | | |
|---|---|---|
| | | මත කම්කරුවන් සේවයට බඳවා ගැනීමට කටයුතු කරන ලදි. |
| ii. 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සභාවේ සේවය කල, ස්ථාන මාරුවී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.25,359 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | එම නිලධාරින් හට අදාල හිඟ මුදල් ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී අතර ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේදී රු.1,735,352 ක් වැය කර මහඔය උණුවතුර බුබුල ආශ්‍රිතව ඉදිකරන ලද ආපනශාලාවෙන් ආදායම් ඉපදවීමට කටයුතු කර නොතිබුණි. | ආපන ශාලාව බදු දීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.4.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. වාහන හා යන්ත්‍රෝපකරණ 09 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන හා යන්ත්‍රෝපකරණ වල අයිතිය පවරා ගත යුතු වේ. | එම වාහන හා යන්ත්‍රෝපකරණ අතරින් බොහොමයක් අබලන් තත්වයේ පවතින බැවින් අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොමැත. ඉදිරියේදී අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. එමෙන්ම දෙවන ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ ලැබූ යතුරු පැදි 02 ක් සම්බන්ධව කිසිදු ලියවිල්ලක් හෝ ලේඛනයක් සභාවට භාර දී නොමැති අතර ඒවා ලබා ගෙන පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| ii. විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ඉඩම් කැබලි 36 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරාගෙන නොතිබුණි. | ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතු වේ. | **මීට ඉහත දී ඉඩම් පවරා ගැනිම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා හරහා ඉඩම් පවරා ගැනිමේ අයදුම් පත්‍රයක් සියලු ඉඩම් සඳහා සම්පූර්ණ කර මහවැලි අධිකාරිය වෙත යවන ලදී. එහෙත් මේ වන තෙක් මහවැලි අධිකාරිය මඟින් මේ සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොමැත. එබැවින් නැවත එම අයදුම්පත්‍රය යැවිමට කටයුතු කරමි.** |

### 3.4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| i. පුරනැගුම ව්‍යාපෘතිය යටතේ 2015 සහ 2017 වර්ෂවල රු.33,926,468 ක් වැය කර කැකරිහේන කඩකාමර 24 කින් සමන්විත සාප්පු සංකීර්ණයක් හා සතිපොලක් ඉදිකර, සාප්පු සංකීර්ණයේ කඩකාමර සඳහා 2015 සහ 2017 වර්ෂ වලදී බදුකරුවන් සමඟ ගිවිසුම් ගත වී තිබුණද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඔවුන් එම කඩකාමර ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර, සතිපොල අදාල කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි. | කඩකාමර බදු දීමට හා සතිපොල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුවේ. | **2015,2017 වර්ෂවල කඩහිමියන් සමඟ ගිවිසුම් අත්සන් කර එම කඩ කාමර වෙළඳුන් සඳහා විවෘත කලද, සාර්ථක වෙළදාමක් නොමැති බැවින් කඩ කුලී මුදල් අඩු කර දෙන මෙන් වෙළඳුන් කිහිප වතාවක දීම ලිපි මඟින් ඉල්ලීම් කරන ලදී.** ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නැවත තක්සේරු වාර්ථාවක් ලබා ගැනීමට තොරතුරු ඉදිරිපත් කර ඇති අතර මේ වන තෙක් අදාල වාර්ථාව අප වෙත ලබා දී නොමැත. අදාල තක්සේරු වාර්ථාව ලැබීමෙන් පසු නැවත කඩ කුලී සංශෝධනයකින් පසු වෙළද සැල් විවෘත කිරීමට අවශ්‍ය කටයුතු කරමි.<br>කැකිරිහේන සති පොල 2017 වර්ෂයේ ආරම්භ කලත් වෙළඳුන් නොපැමිණීම හේතුවෙන් සති පොල නොපැවත්වීමට කටයුතු කරන ලදි. |
| ii. සභාව සතු ධාවනය කල හැකි වාහන හා යන්ත්‍රෝපකරණ **07** ක් නිෂ්කාර්යව තිබුණි. | වාහන හා යන්ත්‍රෝපකරණ ප්‍රයෝජනයට ගත යුතු වේ. | වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක් අබලන් තත්ත්වයේ හා ධාවනය කිරීමට අවශ්‍ය ලිපි ලේඛන නොමැතිකමින් ප්‍රයෝජනයට නොගෙන පවතී. |

### 3.4.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බැකෝ ලෝඩර යන්ත්‍රය 2018 අගෝස්තු 11 වන දින අනතුරට ලක්වීම හේතුවෙන් වම්පස වීදුරුව බිඳීම නිසා රක්ෂණය මඟින් රු.**72,299** ක මුදලක් ලබාදීමට එකඟවී තිබුණු නමුත්, **2019** අප්‍රේල් 11 දින වන විටත් බැකෝ ලෝඩර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | රක්ෂණයෙන් මුදල් ලබාගෙන අළුත්වැඩියා කටයුතු ඉක්මණින් සිදුකල යුතු වේ. | බැකෝ ලෝඩරය සඳහා වම් පස වීදුරුව නැවත යෙදීමට රු.72,299 මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ලබා දීමට එකග වී ඇති අතර අදාල වීදුරුව සේවා සපයන සමාගමෙහි නොමැති බැවින් සමාගම වෙත ලැබීමෙන් පසු අළුත්වැඩියාව සිදු කිරීමට කටයුතු කරමි. |

**3.5 දෘෂ්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය යටතේ 2018 අගෝස්තු 01 දින බඳවාගෙන තිබුණු ආදේශක කම්කරුවන් 03 දෙනෙකු හා ආදේශක රියදුරකු 2018 අගෝස්තු 01 දින ප්‍රාදේශීය සභාවේ සේවයට වාර්තා කර තිබුණු නමුත් එම සේවකයින්ගේ නම් යොදා ගනිමින්, 2018 ජූලි මස සේවය කර තිබුණු බවට ලේඛන සකස් කර 2018 සැප්තැම්බර් 04 වන දින රු.96,768 ක් ගෙවා තිබුණි. | ආදේශක කම්කරුවන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අධීක්ෂණ මට්ටමේ වගකිව යුතු නිලධාරියෙකුගේ නිර්දේශය මත ගෙවීම් කටයුතු සිදුකල යුතු වේ. | 2018 මැයි 11 වන දින පැවැති සභාව මගින් සේවකයින් 04 දෙනෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගෙන 2018 ජූනි 13 දින දැන්වීම් පළ කර ඉල්ලුම් පත් කැඳවා ගෙන 2018 ජූනි 22 වන දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා කම්කරුවන් 04 දෙනෙකු බඳවාගෙන ඇත. 2018 ජූලි මස මෙම සේවකයින් සේවයේ යොදවා ඔවුන් හට වැටුප් ගෙවා ඇත. |

**3.6 ප්‍රසම්පාදන**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 මාර්තු 24 නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව 2018 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වේ. | මේ වන තෙක් ප්‍රාදේශිය සභාවේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැති අතර ලබන වසරේ ප්‍රසම්පාදන සැලැස්මකට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට කටයුතු කරමි |

**3.5.2 සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීම් සඳහා අවම සීමා කාලය ලබාදී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතු වේ. | වර්ෂය අවසන් වීමට පෙර අදාල මිලදී ගැනීම් සිදු කල යුතුව තිබූ බැවින් මාගේ උපදෙස් මත අදාල මිල කැඳවීම් ලිපි අතින් භාරදී කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන ලදී. |